ප්‍රවෘත්තියට ඍජුවම අදාළ වන්නේ නම් විනා, අයෙකුගේ වර්ගය, ආගම පිළිබඳ විස්තර ප්‍රකාශයට පත් කිරීමෙන් වැළකිය යුත්තේය යනුවෙන් මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තුළ දැක්වේ. නමුත්, ලංකාදීප පුවත්පතේ (10/06) "මීගමුවේ සුපිරි ගේක කසිප්පු ගබඩාවක් එක්ක ගණිකා ජාවාරමක්" යන සිරස්තලයෙන් යුතු පුවතෙහි, "[අත්අඩංගුවට ගත්] තරුණියන් වයස අවුරුදු 22-25 වයස්වල පසුවන අතර එක් තරුණියක් මුස්ලිම් තරුණියකි" යනුවෙන් සඳහන් වේ.

ඔබට අනුව, අත්අඩංගුවට ගත් තරුණියන්ගෙන් එක් අයෙකුගේ පමණක් වාර්ගිකත්වය "මුස්ලිම්" කියා සඳහන් කරන්නට පදනම කුමක්ද?

වාර්ගිකත්වය ප්‍රවෘත්තියට අදාළ නොවන්නේ නම් සහ එය සෘණාත්මක සන්දර්භයකදී ඉස්මතු කිරීමක් වන්නේ නම්, මෙහි වාර්ගිකත්වය "මුස්ලිම්" යනුවෙන් සඳහන් කිරීම ඔස්සේ එම වාර්ගිකත්වය සෘණාත්මකව ඒකාකෘතික කිරීම් වලට ලක්වීමේ ඉඩක් නැතිද?

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa**